# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## පුරප්පාඩු

මෙහි පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම් කරනු ලබන්නේ කුමන වරායේ පුරප්පාඩු සඳහා ද යන්න අයදුම්පතෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. එක් එක් වරාය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

### තනතුර : මුහුදු යාත්‍රා සම්බන්ධීකරණ නිලධාරී (ගාල්ල / ත්‍රිකුණාමලය)

(අ) වැටුප :

වැටුප් කාණ්ඩය : 6:3 (SG 3)

මූලික වැටුප : රු. 53,425/=

වාර්ෂික වේතනාධිකය : රු. 1,150/=

(දළ වැටුප මාසිකව රු. 145,000/= ක් පමණ වේ.)

(ආ) යෝග්‍යතාවය :

අ.පො.ස (උ.පෙළ) විභාගයේදී එකවර විෂයන් තුන (03) කින් සමත් වීම.

**සහ**

වෙරළාසන්න මුහුදු ගමන් වල (N.C.V.) යෙදෙන GT3000 කට නොඅඩු නැව්වල යාත්‍රාපතිවරයෙකු වශයෙන් සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ වලංගු ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජය විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන වලංගු ප්‍රවීණතා සහතිකය / එලෙස පිළිගනු ලැබූ වෙනත් උසස් මට්ටමේ වලංගු ප්‍රවීණතා සහතිකය

**හෝ**

ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ වෙනත් උසස් මට්ටමේ වලංගු ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජය විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන වලංගු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

ගෝලීය සමුද්‍ර ආපදා සහ ආරක්ෂක පද්ධති (GMDSS) සහතිකය හෝ ඒ හා සමාන වෙනත් සහතිකයක් ලබා තිබීම.

**සහ**

ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද රේඩාර් නිරීක්ෂණ සහතිකය හෝ ඒ හා සමාන සහතිකය.

**සමග**

**පළපුරුද්ද**

(අ) නෞකාවක කාර්යභාර නිලධාරියෙකු ලෙස වසර එක (01) ක සේවා මුර පළපුරුද්ද

(ඇ) අනෙකුත් අනිවාර්ය අවශ්‍යතා :

i. අධි උච්ච සංඛ්‍යාත පණිවිඩ හුවමාරු උපකරණ (V.H.F) උපයෝගී කර ගනිමින් සංඥා නිකුත් කිරීමේ දැනුම හා හැකියාව

ii. ඉංග්‍රීසි භාෂාවෙන් චතුරව කථා කිරීමේ හැකියාව

(ඈ) වයස් සීමාව : අවුරුදු 18–45 අතර විය යුතුය.

(රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.)

(ඉ) සටහන :

සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සම්මුඛ හා / හෝ ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

**සැලකිය යුතුයි :**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ ඉදිරියේදී සම්පාදනය කරනු ලබන සියළුම නීතිරීති වලට අනුකූලව පත්වීම් ලබන්නන් ක්‍රියාකළ යුතුය.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය පරිදි අධිකාරියේ ඕනෑම අංශයක / කොට්ඨාසයක හෝ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමග **"ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන), මානව සම්පත් සහ පරිපාලන කොට්ඨාසය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13"** යන ලිපිනයට ලැබෙන සේ 2024 ජුනි 24 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"මුහුදු යාත්‍රා සම්බන්ධීකරණ නිලධාරී තනතුර සඳහා"** යනුවෙන් සඳහන් කළ යුතු වේ.

අදාළ සහතිකවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ හෝ රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු/ සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුර සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට සටහනක් තිබිය යුතුය.

**සභාපති**